# 2019 යල කන්න වගා රැස්වීම - මිණිපේ මහා වාරිමාර්ග ව්‍යාපාරය.

- දිනය :- 2019/ 04/ 04
- ස්ථානය :- උඩවෙල සංස්කෘතික මධ්‍යස්ථානය
- වේලාව :- පෙ.ව. 10.00
- සහභාගිත්වය :- පැමිණීමේ ලේඛණය අමුණා ඇත.

සිරිත් පරිදි ආගම සිහිකිරිමෙන් අනතුරුව පිළිගැනිම හා අරමුණ පැහැදිලි කිරිම මිණිපේ නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා විසින් සිදු කරන ලදි.

අරමුණු

1. 2019 යල පෙර වගා තීරණ නීතිගත කිරීම.
2. පොහොර සහනාධාරය සැපයීම.
3. කෘෂිකර්ම කටයුතු,බීජ සැපයීම.
4. වාරිමාර්ග කටයුතු පිළිබඳ සාකච්ඡා කර තීරණ ගැනීම.

මූලාසනය දිස්ත්‍රික් ලේකම්තුමා වෙත භාර කරන ලදි.

| ඉදිරිපත්කරණ නිළධාරියා ආයතනය | කාරණය |
|---|---|
| නේ.ව්‍යා. කලමනාකරු | • පෙර වගා තීරණ සහාගත කිරීම,මෙම තීරණ සංශෝධනයට හැකියාව තිබෙන බව ප්‍රකාශ කරන ලදී. |
| මධ්‍යම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ | • පවතින නියගය සැලකිල්ලට ගතයුතු වන බවත්,පානීය ජල ප්‍රශ්නය විදුලිය ඇණහිටීම ,අභියෝග වන බවත්<br>• මිණිපේ වම් ඉවුර -දකුණු ඉවුර ද්විතියත්වයටම ජලය සැපයිය යුතු වන බවත් මේ සදහා එකම හෝ ආසන්නම දිනයකදී ජලය නිකුත් කල යුතු බව ප්‍රකාශ කරන ලදී.<br>• යල කන්නයට ගැටළු බොහොමයක් කිබෙන බවත් ,සාමුහිකව වැඩ කටයුතු කිරීමෙන් එම ගැටළු විසදා ගත හැකි බවත්<br>• ජල පාලක කමිටු තීරණ අනුව 80% වී,20% අතරේක භෝග වග කල යුතු වන බවත්,<br>• අප්‍රේල් මස 10වන දින ප්‍රධාන ඇළට ජලය මුදා හරින බවත්,විශාල ජල ප්‍රමාණයක් නොලැබෙන බවත්,ලැබෙන ජල ප්‍රමාණය සාමුහිකව බෙදාගත යුතු බවත් වෙනත් ව්‍යාපාර ගැටළුද බාධාවන් විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.<br>• ඇලවල් සුද්ද පවිත්‍ර කිරිම නිසි දිනට කල යුතු බවත් ඕ ඇලවල් නඩත්තුවට සුළු මුදලක් ලැබෙන බවත් ,<br>• පියවර 1,2- - 3,4 ලෙස අදියර දෙකකින් ජලය මුදා හරින අතර අභ්‍යන්තර සැලසුමක් හදාගත යුතු බවත්,ජල පාලකට අමතරව බෙදා හැරීමේ කමිටුවක් පත්කර ගන්න යනුවෙන් ප්‍රකාශ කරන ලදී.<br>• වැඩි මල් වී වලට නොයන ලෙසත්,අතිරේක භෝග වලට යොමු වන ලෙසත් ,මාස 3- 3 ½<br>වී වගා කරන ලෙසත් එසේ නොකෙලහොත් ජලය ලබා දීමේ හැකියාවක් නොමැති බවත්,<br>• රන්දෙණිගල ජලාශයේ පමණක් දැනට ජලය තිබෙන බැවින් ඒකාබද්ධ වැඩ සටහනකට යාම සුදුසු බවත්,රක්ෂණය කර ගැනීමද වැදගත් වන බවත් ප්‍රකාශ කරන ලදී |
| කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ- අන්තර් පළාත් | • මෙවර හොද අස්වැන්නක් ලැබුණු බවත්,<br>• පෙර කන්න තීරණ සුදුසු වූවත් විවිධ හේතු නිසා වෙනස් විය.<br>• එකට වගා කිරීම ජල අපහසුතාවට පමණක් නොව කෘමි හානිය අවම කරගැනීමටද හේතු වන බව ප්‍රකාශ කරන ලදී.<br>• කන්න තීරණ ක්‍රියාත්මක කිරීම තුළ විවිධ වාසි ලැබෙන බවත්,රක්ෂණය කිරීම,ප්‍රතිලාභ ලැබෙන්නේ කන්න තීරණ අනුව වගා කලහොත් පමණක් බවත්,<br>• කන්නය ප්‍රමාද වුවහොත් කෘමි හානි වලට ඉතාමත් හිතකර තත්වයක් ඇතිවන බවත්<br>• තිබෙන තත්වය අනුව යල කන්නය ජය ගනිමු යන්න,<br>• පියවර 3-4 අතිරේක භෝග වලට යොමු වන ලෙසත්,අතිරේක භොග සදහා පැකේජයක් හදුන්වා දී ඇති බවත් රටකජු,බඩ ඉරිගු වැනි භෝග වගා කරන ලෙසත් ,සේනා දළඹුවා දැනට ගැටළුවක් නොමැති බවත්,<br>• නිෂ්පාදන වියදම අඩු කරගැනීම ලාභයට හේතුවන බවත්,<br>• පැල මැක්කා හානිය සදහා බීජ සත්කාරය කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. |

| | |
|---|---|
| පියවර 04<br>ප්‍රා.ගො.සං.ඩී<br>03 සභාපති | • අපගේ පෙර ඉල්ලීම වූයේ මාර්තු 25 ජලය ලබා දෙන ලෙසයි.ජල පාලන කමිටු තීරණ අනුව වෙනසක් සිදු වී ඇති බවත් අප්‍රේල් මස 10 වෙනි දින ජලය ලබා දෙන බවත්,<br>• සංවර්ධන කටයුතු හේතුවෙන් ප්‍රධාන ඇළ යම් යම් බාධක තිබෙන බවත්,ජලය ලබා දීමට පෙර එම බාධක ඉවත් කරදිය යුතු බවත්,<br>• දුනුවිල පිටිය රොන්මඩ පිරීම ඉවත් කරන ලෙස ඉල්ලීමට පිළිතුරක් නොමැති බවත්,තුල්හිරිය මඩ හොරොව්වට මුදල් ලැබී නොමැති බවත්,<br>• මාස 1 ½ පමණවත් ඇළේ ජලය ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලදී.<br>• ගොඩ ඉඩම් වගාවට වගාළිං අවසර දෙනවාද? බවත්,<br>• අළුත්තරම අතිරේක භෝග බීජ මිලදී ගන්නේ අඩුවෙන් බව ප්‍රකාශ කරන ලදී.<br>• පසුගිය කන්නය 3-4 පියවරට ගැටළු තිබුණු බවත්,<br>• 2018 මහ කන්නයේ කෘෂි රක්ෂණ වන්දි කිහිප දෙනෙකුට ප්‍රමාද බවත්,<br>• කෘෂිකර්ම කමිටුවට අදාල නිලධාරින්ගේ නොපැමිණීම ගැටළුවක් බවත්,<br>• පවතින වියළි තත්වය හේතුවෙන් කුඹුරු තෙත් කර ගැනීමට වැඩි ජලයක් අවශ්‍යවන බවත් ප්‍රකාශ කරන ලදී. |
| පියවර 4 ඩී 4<br>නියෝජිත | • තම ගොවි සංවිධානය කන්නයක් වගා නොකර පරිත්‍යාග කල බවත්,ඔවුන්ගේ ගැටළු වලට ප්‍රමුඛතාවය හිමි විය යුතු බවත්,ජල කමටිමුව අඛණ්ඩව පවත්වන බවත් කියා සිටින ලදී. |
| ප්‍රධාන<br>ඉංජිනේරු<br>කලීල් මහතා<br>මිණිපේ වම්<br>ඉවුර ව්‍යාපෘතිය | • ඇලේ වැඩ කෙරෙමින් පවතින බවත්,බාධක ඉවත් කරන බවත්,ව්‍යාපෘතියේ වැඩ තවත් බොහෝ සේ තිබෙන බවත්,<br>• වගාවට යොදන කාලය කෙටි කර අපට කාලය ලබා දෙන්න යනුවෙන් ඉල්ලීම් කරන ලද ඉදිරියට මාස 02ක් අවශ්‍ය බවත්,<br>• කන්න තීරණ වලට ගොවීන් යොමු කරන්න යනුවෙන් ප්‍රකාශ කල බවත්,<br>• දැනටමත් ව්‍යාපෘතියේ කාලය කෙටි වෙමින් පවතින බවත්,<br>• දුනුවිල වැව අඩුපාඩු ව්‍යාපෘතියෙන් නොකෙරෙන බවත්,එයට වෙනත් විකල්පයක් සොයමු යනුවෙන් ප්‍රකාශ කරන ලදී. |
| ව්‍යාපාර ගොවි<br>සංවිධාන<br>සභාපති | • ප්‍රධාන ඇළේ බාධක ඉවත්කර නොමැති බවත්,<br>• 3,4 පියවර වලට ජලය දීමේ අපහසුතාවය මග හැර ගැනීම සඳහා නිරීක්ෂණයකට යැම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. |
| ගොවිජන සේවා<br>නිලධාරි<br>හෙට්ටිපොල | • වගා ළිං සඳහා අවසර දෙන නමුත් නිර්දේශ ලබා දෙනවිට තනි පුද්ගලයෙකුට පමණක් අවසර නොදෙන බවත් සමූහ වශයෙන් වගා කරන පුද්ගලයන්ට වගා ළිං සඳහා අවසර ලබා දෙන බවත්, |
| 4 පියවර<br>ප්‍රියන්ත මහතා | • මිණිපේ ව්‍යාපාරය මහවැලියට අත්පත් කර ගැනීමට සූදානමක් ඇති බවට ප්‍රචාරයක් යන බවත් එය සත්‍යක් ද යන්න විමසා සිටින ලදි. |
| මධ්‍යම පළාත්<br>වාරිමාර්ග<br>අධ්‍යක්ෂ | • මිණිපේ ව්‍යාපාරය තිබෙන ක්‍රමය එසේම පවතින බවත් අභ්‍යන්තර සංවර්ධනය කරගැනීම මූලික අදහස් බව ප්‍රකාශ කරන ලදී. |
| ව්‍යාපාර ගොවි<br>සංවිධාන<br>සභාපති | • මහවැලියට ගැනීමේදී ඇතිවන දුෂ්කරතා පිළිබඳ කරුනු ඉදිරිපත් කරන ලද අතර එය වැලැක්වීමට අවශ්‍ය කටයුතු කල යුතු බවත් |
| පියවර 3<br>ප්‍රා.ගො.සං.සභා<br>.උපාලි<br>ජයතිස්ස මහතා | • 2018/19 මහ කන්නය සාර්ථක කර ගැනීමට සහය වූ සැමට ස්තූතිය පල කරන ලදී.<br>• ප්‍රධාන ඇළේ අතීතය හා වර්තමානය ගලපා අදහස් දක්වන ලද අතර තවමත් වැඩ අවසානයක් නොමැති බවත්,<br>• ජලය ලබා දීමේ දිනය වෙනස්වීම ගොවීන් නොසන්සුන් වීමට හේතු වූ බවත් පවසන ලදී.<br>• ක්‍රිප් වැඩසටහන යටතේ ඩී 39,ඩී 43,ඩී46,ඩී47,ඩී 51,ඩී 56,ඩී 57 සංවර්ධනය වෙන බවත්,<br>• ඉදිරි කන්නත් සමග ගොවිතැනට අවශ්‍ය වටා පිටාව හොද ආකාරයට සැකසෙන බවත්,<br>• හෙට්ටිපොල ප්‍රාදේශීය නිලධාරිතුමාගේ සේවය අගය කලයුතු බවත්,<br>• බිත්තර වී මිල අධික බවත්,වැව් වල රොන් මඩ පිරී තිබෙන බවත්,<br>• ප්‍රාදේශීය නිලධාරි කාර්යාලයට බීජ වී ලබාදෙන ලෙසත් දැනටමත් ප්‍රධාන ඇළේ ජලය උපයෝගි කරගනිමින් අතිරේක බෝග වගා කරමින් සිටින බවත්,<br>• වැව් ගොඩ වන විට වල් අලීන්ගෙන් විශාල හානියක් සිදුනව බවත්,<br>• පරිත්‍යාග කර කන්නත් සමග නාම ලේඛන අනුව බීජ වී ඉදිරි කන්නයට ලබාදෙනු ඇතැයි බලාපොරොත්තු වන බවත්,<br>• හීං ගග අමුණ 3,4 පියවරයන්ට විශාල වටිනාකමක් ලබාදෙන බවත්,<br>• මෙම කන්නය සාර්ථක කර ගැනීමට උදව් උපකාර කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින ලදී. |

| | |
|---|---|
| ව්‍යාපාර ගොවි සංවිධාන සභාපති ගමගේ මහතා | • 2019 යල කන්නය තීරණාත්මක බවත්,රන්දෙණිගල ජලාශයේ පමණක් 86%ක ජල ධාරිතාවක් පවතින අතර නියගය අනුව එයද අවිනිශ්චිත බවත්,<br>• මහවැලිය ගැනීම පිළිබද වාරිමාර්ග අධ්‍යක්ෂතුමාගේ ස්ථාවරය පිළිබද ස්තූතිය හිමිවන බවත්,ගොවින්ගේද අඩු පාඩු බොහොමයක් තිබෙන බවත්,<br>• ජල පාලන කමිටුවේදී තමා පැවසූ කරුණු හා එහිදී ගත් තීරණ ප්‍රකාශ කල අතර ඉක්මනින් මහ සභා පවත්වා ගොවීන් දරනුවත් කර නිසි කලට වගාව අවසන් කිරීමට වගබලා ගතයුතු බවත්,<br>• දෙවැනි පියවර සංවර්ධන කටයුතු වෙනත් පියවරට සමගාමීව අඩුවක් දකින බවත්,පියවර 2 ජල අපතේ යාම වැඩි වන බවත්,ප්‍රතිකර්ම අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.<br>• ඩී 18,19,20 සංවර්ධනය නොවන බවත්,අඩුපාඩුද දක්නට ඇති බවත්,සංවර්ධනයට දායක වූ සැමට ස්තූතිය හිමි වන බවත්,<br>• වී අලෙවිය ,අලෙවි නිලධාරින්ගේ නොපැමිණීම කණගාටු වන බවත්,වී අලෙවියේදී බැංකුවක හැසිරීම තුල ගොවීන් පත්වන අපහසුව ගැනත් සුළු වී මෝල් හිමියන්ගේ අඩු දායකත්වය පිළිබදවත්,<br>• පියවර 3 ඩී 42 ඉඩම් ආරවුලක සුලමුල පිළිබදවත් ප්‍රකාශ කරන ලදී.<br>• තවත් සංවර්ධනය නොවන ඇලවල් පිළිබද පැහැදිලි කරන ලදී.<br>• ගොවිමහතුන්ට වී මිල අඩු කිරීමක් නොකරන ලෙස ඉල්ලීම් කරන ලද අතර සියලු දෙනාට යල කන්නයට සුභාශිංසනය ප්‍රකාශ කරන ලදී. |
| වාරිමාර්ග අධ්‍යක්ෂතුමා | • වැවැක ජලය පිරෙන සීමාවන් තුළ අනවසර කටයුතු වලට නීතිමය පියවර ගැනීමට හැකි බව ප්‍රකාශ කරන ලදී. |
| 4 පියවර කරවිගහවැව අංක 01 සභාපති | • ගැටළු ඉදිරිපත් කල අතර වැවේ රොන්මඩ පිරීම ,අතිරේක භෝග අලෙවි ගැටළුව, අතිරේක භෝග වගාවේ අවදානම පිළිබද ප්‍රකාශ කරන ලදී. |
| කෘෂි රක්ෂණ මණ්ඩලය අධ්‍යක්ෂ මහනුවර | • කන්න තීරණ වලින් පරිබාහිරව වගාව සිදු කිරීම හේතුවෙන් සමහර පුද්ගලයන්ගේ වන්දි මුදල් ප්‍රතික්ෂේප වීමට හේතුව බවත්,<br>• කන්න තීරණ වලට අනුව වගා කරන අයට අවශ්‍ය දේ ලබා දීමට කටයුතු කරන බවත්,<br>• කන්න රැස්වීමේ ගනු ලබන තීරණ අනුව ඒ දිනයට හෝ ඊට පෙර වගාව ආරම්භ කිරීම සුදුසු බවත්,<br>• කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ කර තිබෙන කන්නයට අදාල ප්‍රභේදයට පමණක් වගා කිරීම සුදුසු බවත්,<br>• අභියාචන පිළිගන්නා අතර විමසා බැලීම් කටයුතු සිදු කරන බවත්,<br>• කෘෂිකර්ම ප්‍රාදේශීය නිළධාරි නිර්දේශ මත ප්‍රධාන වශයෙන් වන්දි නිර්දේශ වන්නේ නියගය,ගංවතුර,වන අලි හානි පමණි.<br>• වගා කරන භෝග වර්ග 05කට පමණක් වන්දි ගෙවීම සිදු කරන බවත්,අමතර රු 200.00ක ආවරණයක් ගතයුතු බවත්,රක්ෂණය විය යුතු අවසන් දිනය නියතව සඳහන් විය යුතු බවත්, |
| ප්‍රා.නිළධාරි උල්පතගම | • අප ප්‍රදේශයේ සුළු වාරි 71 පමණ තිබෙන බවත්,කන්න රැස්වීම් තීරණ මහාවාරි සහ සුළු වාරි ලෙස වෙනස්වන බැවින් දින වකවානු ගැටළු සහගත බව ප්‍රකාශ කරන ලදී. |
| රක්ෂණ භාර අධ්‍යක්ෂ | • සුළු වාරිමාර්ග කන්න තීරණ පැහැදිලිව අපවෙත වාර්තා කරන ලෙස ඉල්ලීම් කරන ලදී. |
| මාතලේ කෘෂි රක්ෂණ මණ්ඩල අධ්‍යක්ෂක | • මිලියන 30ක වන්දි ලැබී ඇති බවත්,2018 වර්ෂයේ යල වන්දි තවමත් නොලැබී ඇති බවත්,ගොවින්ගේ විවිධ අඩුපාඩු හේතුවෙන් එසේ සිදු වී තිබෙන බවත්,වන්දි පසුව ලැබෙන බවත් ප්‍රකාශ විය. |
| වාරිමාර්ග අධ්‍යක්ෂ (මධ්‍යම) | • ක්‍රිප් ව්‍යාපෘතිය ලැබුණු සහ ලබාගත් අයුරු පැහැදිලි කල අතර කොන්ත්‍රාත් කරුවන්ගේ ප්‍රමාදයන් හේතුවෙන් ඇතිවූ ගැටළු ප්‍රකාශ කරන ලදී.<br>• පියවර 3 ප්‍රධාන ඇල පවතින බාධක ගැනද කරුණු ඉදිරිපත් කරන ලදී.<br>• යන්ත්‍රෝපකරණ ලබා දී ඇති බවත්,ඇස්තමේන්තු සකස් කළේ ලැබුණු මුදල් ප්‍රතිපාදන වලට අනුව බවත්,<br>• මුතියංගන ඔය සැදුවහොත් ඉහළ කුඹුරු යටවෙන තත්වයක් තිබෙන බවත් එය නැවත විමසා බලන බවත්, |

| | |
|---|---|
| | • යෝජිත හීං ගග ව්‍යාපෘතිය පිළිබද පැහැදිලි කරන ලදී.<br>• මහවැලියට ගැනීම පිළිබද සාකච්ඡා කල අතර මිණිපේ අයිතිය පිළිබදද පැහැදිලි කරන ලදී. |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ මාතලේ | • වී මිලදී ගැනීමට දිසාපතිතුමාට මිලියන 50ක් ලැබුණු බවත්,ප්‍රාදේශීය ලේකම්තුමාට යොමු කල බවත්,දැනට මෙට්‍රික්ටෝන් 136.03 මිලදී ගෙන තිබෙන බවත්,දැනට වැයවී ඇත්තේ මිලියන 5ක් බවත්, |
| ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි-හෙට්ටිපොල | • බීජ වී තිබෙන බවත්,සේවා සැපයුම් සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී.<br>• බැංකු ණය ලක්ෂ 70ක් පමණ දී තිබෙන බවත්,පොළිය 4%ක් බවත්,<br>• සමහර ආයතන සමග ගැටළු තිබෙන බවත්,ඒකාබද්ධව කටයුතු කරන බවත්,<br>• අක්කර 20ක අස්වැන්න ගෙන යාමට පාරක් හරස් කිරීමක් පිලිබද ප්‍රකාශ කල අතර එයට නීති මගින් ක්‍රියා කරනු ඇති බව ප්‍රකාශ කරන ලදී. |
| මල්ගම්මන සභාපති | • බීජ වී බුසල් 1750ක් පමණ තිබෙන බවත් පිට අයගෙන් බීජ වී නොගන්නා ලෙස ඉල්ලීම් කරන ලදී.<br>• බීජ වී මිලදී ගන්නා විටම ගොවීන්ට මුදල් ගෙවීම සිදු කල යුතු බවත්,වැඩි මිලට බීජ වී අලෙවියක් තිබෙන බවත්,කිලෝග්‍රෑම් 50 මිටිම ලබාදෙන ලෙස ද ඉල්ලීම් කරන ලදී.<br>• පොහොර නිර්දේශය වැඩිකරන ලෙසත් ඉල්ලීමක් කරන ලදී. |
| වනජීවී කාර්යාලය | • අලි මිනිස් ගැටලුව පැහැදිලි කල අතර අලි වෙඩි ,වාහන හා නිලධාරි හිගය නිසා ගොවීන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට ප්‍රමාදයක් පවතින බවත්,<br>• තිබෙන අලි වෙඩි සාධාරණව ලබා දෙන බවත්,අලින්ගේ සංක්‍රමණය දැනට බහුලව සිදුවෙන බවත් ප්‍රකාශ විය. |
| පියවර 1 ප්‍රා.ගො.සං. සභාපති | • දැනට වනජීවී නිලධාරින් හට තිබෙන අඩුපාඩු අපහසුකම් පැහැදිලි බවත්,ඔවුන්ට දොස් තැබීමේ තේරුමක් නොමැති බවත්,ඉහළ නිළධාරින් දැනගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. |
| ප්‍රාදේශීය ලේකම් මිණිපේ | • වී මිලදී ගැනීම සඳහා මිලියන 10ක් මුදල් ලැබී තිබෙන බවත්,ගබඩා 02ක් විවෘතව තිබෙන බවත්,<br>• දැනට වී කිලෝග්‍රෑම් 34300ක් පමණ මිලදී ගෙන ඇති බවත්,<br>• ප්‍රාදේශීය ලේකම් කර්යාලයේ ගිණුම් තිබෙන්නේ මහජන බැංකුවේ නිසා ප්‍රමාදයන් ඇති වය හැකි බවත් ප්‍රකාශ විය. |
| දිස්ත්‍රික් ලේකම් මහනුවර | • ඉතා චතුර ලෙස ගොවීන් අදහස් ප්‍රකාශ කල අතර ඉදිරිපත් වූ ගැටළු සාකච්ඡා කරන බවත්,<br>• වන අලි ගැටළු ,පොහොර බෙදා දීමේදී ඇතිවන ගැටළු ආදි අභ්‍යන්තරව විසදිය හැකි ගැටළු විසදා ගනිමු යනුවෙන් ප්‍රකාශ කරන ලදී.<br>• සංවර්ධන වැඩ කටයුතු වලට කාලය ලබාදෙන බවත්,<br>• සකස් කරගත් කන්න රැස්වීම් කාල සටහනට අනුව නිසි කලට වගා කටයුතු කලයුතු වන බවත්,<br>• වගකීම් සාමුහිකව ඉටු කිරීම,නිළධාරින් හා ගොවීන් සමීපව කටයුතු සිදු කලහොත් ගැටළු අවම කර ගත හැකි බවත්,<br>• වගා කරන කන්නය පසුගිය කන්නය මෙන්ම හොද කන්නයක් වේවා යනුවෙන් ප්‍රාර්ථන ාකල අතර රැස්වීම සාර්ථක කර ගැනීමට සහය ලබාදුන් සැමට ස්තුතිය පිරිනමන ලදී |
| ව්‍යාපාර කමිටු ලේකම් | • මිණිපේ යල කන්න රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා මෙතෙක් සහාය දැක්වූ හිටපු දිස්ත්‍රික් ලේකම්තුමාට හා අලුතෙන් පැමිණි දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු සියලුම රාජ්‍ය නිළධාරින්ට හා සියළුම ගොවි සංවිධාන නිළධාරින්ට ස්තුතිය ප්‍රකාශ කරන ලදී. |



එම්. ඒ. නී. බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය
නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය
මොරයාය, මිනිපේ

**1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් සංශෝධිත 5 වගන්තියේ 6 වන උප වගන්තිය ප්‍රකාරව පවත්වන කන්න තීරණ 2019 යල කන්නය - මිණිපේ ව්‍යාපාරය-2019/04/04**
**අමුණෙන් ජලය නිකුත් කිරීම -2019/04/10 දින**

| කරුණ | 1පියවර | 2 පියවර | 3 පියවර | 4 පියවර |
|---|---|---|---|---|
| වගා කරන බිම් ප්‍රමාණය (අක්කර ) | 5643 | 4819 | 3482 | 2668 |
| වී වර්ගය | මාස 2 ½ , 3 , 3 ½ | | | |
| වී වගා කරන ප්‍රමාණය (%) | 85% | | | |
| වෙනත් බෝග වගා කරන ප්‍රමාණය (%) | 15% | | | |
| | 1,2 පියවර | | 3,4 පියවර | |
| මුල් වරට ජලය නිකුත් කළ යුතු දිනය | 04/30 | | 04/18 | |
| ඇල සුද්ද කර අවසන් කල යුතු දිනය | 04/25ට පෙර | | 04/10 ට පෙර | |
| බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය | 04/30 | | 04/22 | |
| බීජ/ පැල සිටුවා හෝ වපුරා අවසන් කළ යුතු දිනය | 05/20 | | 05/10 | |
| මුර ජලය නිකුත් කිරීම | 05/20 | | 05/10 | |
| අවසන් ජල මුරය නිකුත් කිරීම (වී සඳහා) | 08/20 | | 08/10 | |
| අස්වනු නෙලා අවසන් කල යුතු දිනය | 09/30 | | 09/10 | |
| රක්ෂණය කළ යුතු අවසන් දිනය | 05/20ට පෙර | | 05/10ට පෙර | |

**1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් සංශෝධිත 5 වගන්තියේ 6 වන උප වගන්තිය ප්‍රකාරව පවත්වන කන්න රැස්වීමට අදාල සකස් කර ගන්නා රීති**

1. කෙත් ඇලවල්වල හා බෙදුම් ඇලවල්වල නඩත්තුව සඳහා අක්කර 01 කට රුපියල් 200 ක් ගොවි සංවිධාන විසින් අය කිරීම.

2. ජලය සොරා ගන්නන් සහ වාරි පද්ධතියට හානි කරන්නන් සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තු තක්සේරුවට අනුව දඩ අය කිරීම.

3. නියමිත දිනයට කෙත් ඇල සහ බෙදුම් ඇල පද්ධතිය (තම කොටස) සුද්ධ නොකරන ගොවීන් සඳහා දුර 20mක් සඳහා රු 1000 .00 ක් හා ඊට වැඩි වන සෑම මීටරයකටම රු 50/=ක් ලෙස දඩ අයකරනු ලබන අතර, නොගෙවන්නේ නම් සමත මණ්ඩලය මගින් දඩය අය කර ගැනීම.

4. පොහොර ලේඛනය නිර්දේශ කිරීමේ දී ඇල පද්ධතිය ශුද්ධ නොකරන ගොවීන් සඳහා සාමාජිකත්වය තහවුරු නොකිරීම

5. වෙනත් -
   * අක්කරයක් සඳහා කොම්පොස්ට් පොහොර කිලෝ 2000 ක් යෙදීම අනිවාර්ය වේ.
   * පිදුරු ගිණිතබා විනාශ කරන්නන්ට රු 2000.00ක දඩ මුදලක් නියම කිරීම.
   * මිණිපේ ව්‍යාපාරයේ දුම්කොළ වගාව සම්පූර්ණයෙන්ම තහනම් කිරීම.
   * රක්ෂිත වගාකිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම. (ප්‍රධාන ඇල, බෙදුම් ඇල, කෙත්ඇල)

මහනුවර දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්

## ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - මිණිපේ ව්‍යාපාරය

## රාජ්‍ය නිලධාරින්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය - 2019/ 02/ 21

| අඅ | නම | ආයතනය | තනතුර |
|---|---|---|---|
| 1. | ඩි.එම්.එන්.ජී.ටී.කරුණාසේන | දි. ලේ.කාර්යාලය - මහනුවර | දිස්ත්‍රික් ලේඛම් |
| 2. | එන්.ජී.සී.බණ්ඩාර | දි.ලේ.කාර්යාලය - මාතලේ | සහකාර අධ්‍යක්ෂ |
| 3. | එම්.එම්.එස්.සේනාරත්න | දි.ලේ.කාර්යාලය - මාතලේ | සහකාර අධ්‍යක්ෂ |
| 4. | ඒ.ජී.අරුණතිලක | ි.ලේ.කාර්යාලය -මහනුවර | |
| 5. | එච්.එම්.ආර්.බණ්ඩාර | දි.ලේ.කාර්යාලය -මහනුවර | නි.කෘෂි.අධක්ෂ |
| 6. | අජිතා මානික්‍රම | දි.ලේ.කාර්යාලය - මාතලේ | නි.කෘෂි අධ්‍යක්ෂ |
| 7. | **M.A.D.** බණ්ඩාර මයා | වාරි.කල. අංශය | නේ. ව්‍යා. කළමනාකරු |
| 8. | ඒ.එල්.අරවින්ද මයා | වාරි. දෙ - හසලක | වාරි.ඉංජි |
| 9. | **M.J.M** කලීල් මයා | අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| 10. | ජී.අරුණතිලක | නි.කෘෂි අධ්‍යක්ෂ කාර්යාලය - හසලක | නි.කෘ.අධ්‍යක්ෂ |
| 11. | ඩි.එන්.කේ.දිසානායක | ප්‍රා.ලේ.කාර්යාලය - හසලක | ප.ග්‍රා.නිලධාරි |
| 12. | ටි.එම්.ටි.අසෙව් | කෘෂිරක්ෂණ මණ්ඩලය | සහකාර අධ්‍යක්ෂ |
| 13. | ඩබ්.එස්.සී ඒකනායක | වාරි. දෙ | කොට්ඨාස සහකාර |
| 14. | ජයන්ත ශ්‍රී ආනන්ද | ගොවි.සං.දෙ-මොරයාය | ගොවි. සං. ප්‍රා. නිළධාරී |
| 15. | පී.ජී.එන්.කේ.ගුණරත්න | ගො.සං.දෙ-උල්පතගම | ගොවි. සං. ප්‍රා. නිළධාරී |
| 07. | කේ.එම්.එස්.සී, ගුණසේන | ගොවි.සං. කාර්යාලය-හදුන්ගමුව | ගොවි. සං. ප්‍රා. නිළධාරී |
| | අයි.කේ.ජී.ඒ.සමරජීව | ගොවි සං.කාර්යාලය - හෙට්ටිපොල | ගොවි සං.ප්‍රා.නිලධාරි |
| 08 | කේ.ටී.ආර්.ප්‍රේමදාස | වාරි .කල.අංශය | ආයතන සං. නිලධාරි |
| | එම්.එම්.ඒ.ජී.තිලකරත්න බංඩා | එම | සං.සහකාර |
| | ඩි.ජී.ජේ.එන්.කුමාරි | එම | එම |
| 13. | ඊ.ඒ.එන්.ඩී එදිරිසිංහ | වාරි.දෙ | ඉංජි.සහකාර -1 පියවර |
| | එල්.ජී.බී.පී.එන් බණ්ඩාර | වාරි.දෙ | ඉංජි.සහකාර -1 පියවර |
| 14. | එම්.ජී.රූපසිංහ | එම | ඉංජි.සහකාර -2 පියවර |
| 15. | ඒ.එම්.ආර්.ඩී.අතපත්තු වෙනුවට(ක්ෂේත්‍ර සහකාර) | එම | ඉංජි.සහකාර -3 පියවර |
| 16. | බී.කේ.ඒ.නිරෝෂන් | එම | ඉංජි.සහකාර -4 පියවර |
| | යූ.එම්.පි.ආර්.බි.උඩකුඹුර | අයකිරීම් නිලධාරි | ප්‍රා.සං.බැංකුව - උඩවෙල |
| | | | |

## <u>ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම  - මිණිපේ ව්‍යාපාරය</u>

### ගොවි සංවිධාන නිලධාරින්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය - 2019/ 02/ 21

### 1 පියවර

| අඅ | නම | ගො.සං | තනතුර |
|---|---|---|---|
| 1. | වයි.එම්.ඩබ්.ජී.බිසෝමැණිකේ මිය | ඩී 01 | සභාපති |
| 2. | ඩබ්.එම්.කේ.ජී.අබේරත්න මයා | ඩී 8 | සභාපති |
| 3. | සමුදය බාලසූරිය මයා | ඩී 12 | සභාපති |
| 4. | ඒ.එම්.විජේසිංහ මයා | ඩී 13 | සභාපති |
| 5. | ජේ.එම්.විජේරත්න බංඩා මයා | ඩී 19 | භාණ්ඩාගාරික |
| 6. | ඒ.ඩබ්.ඒකනායක මයා | ඩී 21 | සභාපති |
| 7. | කේ.ජී. ධර්මදාස මයා, | ඩී 24 | සභාපති |
| 8. | එච්.එම්.ඥානවිමල මයා, | ඩී 25 | සභාපති |
| 9. | සී.බී.මාරසිංහ මයා | ඩී 26 | සභාපති |
| 10. | ජී.ජී.ජිනදාස මයා | ඩ 31 | සභාපති |
| 11. | ඩී.එම්.ඒ.නවරත්න මයා | ඩී 32 | සභාපති |
| 12. | සම්පත් ශ්‍රී බුද්ධික බණ්ඩාර මයා | ඩී 35 | සභාපති |
| 13. | එස්.එම්. අබේරත්න මයා, | ඩී 39 | සභාපති |
| 14. | ආර් .එම්. ජයවර්ධන මයා, | ඩී 41 | සභාපති |
| 15. | ඒ.එම්. ධර්මසේන මයා, | ඩී 43 | සභාපති |
| 16. | ඒ.එම්.ඩබ්. සෙනවිරත්න මයා, | ඩී 45 | සභාපති |
| 17. | එම්.ඒ.එස්.චන්ද්‍රසේන | ඩී 47 | සභාපති |
| 18. | එම්.ජී. ජයවර්ධන මයා, | ඩී 49 | සභාපති |

**2** පියවර

| අඅ | නම | ගො.සං | තනතුර |
|---|---|---|---|
| 19 | රංජිත් තිලකරත්න | ඩී 1 | ලේඛම් |
| 20 | එස්.ඒ.ඩබ්.ඒ.ජයරත්න | ඩී 2 | සභාපති |
| 21 | වයි.එම්.පොඩි නිලමේ | ඩී 4 | සභාපති |
| 22 | සී. රාජකරුණා  මයා, | ඩී 7 | සභාපති |
| 23 | ජේ.එම්.කේ.ජී. විජේරත්න මයා, | ඩී 11 | සභාපති |
| 24 | ආර්.ජී ජයරත්න මයා | ඩී 12 | සභාපති |
| 25 | ඩබ්.ජී. වාලි මයා | ඩී 17 | සභාපති |
| 26 | ඩබ්.ජී.සෙනෙවිරත්න මයා | ඩී 18 | සභාපති |
| 27 | ඩබ්.ජී.මිත්‍රසේන මයා, | ඩී 21 | සභාපති |
| 28 | ඒ.පී.වී.ජී.එස්.  ගමගේ මයා, | ඩී 24 | සභාපති |
| 29 | කේ.එම්.ජී. අබේරත්න මයා, | ඩී 25 | සභාපති |
| 30 | වයි.එම්.කේ.ජී.ටිතබ්.කපුවෙමුල්ල | ඩී 27 | සභාපති |
| 31 | මල්ලිකා කුමාරි මිය, | ඩී 29 | සභාපති |
| 32 | ඒ.ජී.චන්ද්‍ර සේන මයා, | ඩී 30 | සභාපති |
| 33 | ජී.ටිකිරි බංඩා මයා | ඩී 31 | සභාපති |
| 34 | එච්.එම්. යසරත්න මයා, | ඩී 32 | සභාපති |
| 35 | පි.ඇල්පිටිය | ඩී 34 | සභාපති |

## 3පියවර

| අඅ | නම | ගො. සං | තනතුර |
|---|---|---|---|
| 36 | ජී.ඒ.වී.සෙනෙවිරත්න | ඩි 35 | සභාපති |
| 37 | ඩබ්.ජී. නිහාල් කිත්සිරි ප්‍රේමතිල මයා, | ඩි 42 | සභාපති |
| 38 | ආර්.ඩබ්.එම්.නිමල් ශාන්ත රාජපක්ෂ | ඩි 43 | සභාපති |
| 39 | ඒ.එම්.ශාන්ත කුමාර | ඩි 47 | සභාපති |
| 40 | ජී.එම්.ජී.ගුණසේන මයා, | ඩි 51 | සභාපති |
| 41 | ආර්.කේ. චන්ද්‍රරත්න මයා, | ඩි 52 | සභාපති |
| 42 | ඩී.ජී. ලොකුබණ්ඩා මයා, | ඩි 56 | සභාපති |
| 43 | කේ.පී.ජී. උපාලි ජයතිස්ස මයා, | ඩි 57 | සභාපති |
| 44 | එස්.ඊ. චන්ද්‍රලතා මිය, | දේවගිරිය | සභාපති |
| 45 | පි.ජී. ජයසිංහ මයා, | බෝගහවැව | සභාපති |
| 46 | එම්.එම්.එස්.බංඩාර මයා, | මාරකවැව | සභාපති |
| 47 | කේ.ජී.ප්‍රේමදාස මයා | රදුන්නවැව | සභාපති |
| 48 | ආර් එම් ආනන්ද රත්නායක මයා, | ගුරුවෙලයාය | සභාපති |
| 49 | එච්.ඒ.ගුණසූරිය | මල්ගම්මන | සභාපති |
| 50 | රංජිත් අමරසේන | | සභාපති |

## 4පියවර

| අඅ | නම | ගො. සං | තනතුර |
|---|---|---|---|
| | වී.ජී.ප්‍රියන්ත කුමාර | ඩි 1 | සභාපති |
| 51 | එස්.ඩබ්.එන්.ඩබ්. ජයරත්න මයා, | ඩි 2 | සභාපති |
| 52 | ඊ.එම්.කුමාර සිංහ | ඩි 3 | සභාපති |
| 53 | ඩබ්.ජී. රංබණ්ඩා මයා, | ඩි 4 | සභාපති |
| 54 | ආර්.කේ.ජී. හේරත් බණ්ඩා | 05 | සභාපති |
| 55 | ඒ.ජී.සමරකෝන් බණ්ඩා මයා | කරවුගහවැව 1 | සභාපති |
| 56 | එම්.ආර්.ජී.චන්ද්‍රසිරි, | ඩි 58 | සභාපති |
| 57 | ඩී.ඩී.ජී.ජී.දුමින්ද වික්‍රමසිංහ | අරුණළු | සභාපති |